බුද්ධශාසන අමාත්‍යාංශය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී බු. ව. 2563 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2019

002547

9 ශ්‍රේණිය

විභාග අංකය :

කාලය පැය 01 විනාඩි 30 යි.

(i) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (ii) හා (iii) කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

(i) කොටසට ලකුණු 40 කි. (ii) හා (iii) කොටස් සඳහා ලකුණු (15×04) 60 කි.

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. බුදුන් වහන්සේගේ ගුරු තනතුරට උන්වහන්සේ විසින් පත්කරගනු ලැබුවේ . . .
   (i) විනය යි. (ii) ධර්මය යි.
   (iii) ආලාරකාලාම තවුසා යි. (iv) උද්දකරාමපුත්ත තවුසා යි.

02. "බමුණා දන්දීම සඳහා ජාති ගෝත්‍ර විමසීමෙන් ඵලයක් නැත. සීලාදී ගුණධර්ම ගැන විමසා දන්දීමෙන් යහපත් ප්‍රතිඵල ලැබේ" යයි බුදුරදුන් දේශනා කළේ කා හටද ?
   (i) කසී භාරද්වාජ බමුණාටය. (ii) අක්කෝස භරද්වාජ බමුණාට ය.
   (iii) සුන්දරික භාරද්වාජ බමුණාටය. (iv) අග්ගික භාරද්වාජ බමුණාටය.

03. සප්ත අපරිහානී ධර්ම අනුගමනය කළේ කා විසින්ද ?
   (i) මල්ල රජදරුවන් විසිනි. (ii) වජ්ජි රජ දරුවන් විසිනි.
   (iii) අජාසත් රජු විසිනි. (iv) ලිච්ඡවි රජ දරුවන් විසිනි.

04. ඡන්ද, චිත්ත, වීරිය, විමංසා යනු . . .
   (i) සතර සංග්‍රහ වස්තු ය. (ii) සතර බ්‍රහ්ම විහරණ ය.
   (iii) සතර ඍද්ධිපාද ය. (iv) සතර සම්‍යක් ප්‍රධාන වීර්ය ය.

05. ජීවමාන බුදුරජාණන් වහන්සේ වෙතින් අවසන් වරට පැවිදි උපසම්පදාව ලැබූ ශ්‍රාවකයන් වහන්සේ කවුද?
   (i) බක්කුල හිමියන් ය. (ii) උපවාන හිමියන් ය.
   (iii) නාගිත හිමියන් ය. (iv) සුභද්‍ර හිමියන් ය.

06. "යෝ ච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සො නප්පමජ්ජති
   සො ඉමං ලෝකං පභාසේති - අබ්භාමුත්තෝව චන්දිමා" මෙය කාගේ උදාන වාක්‍යක්ද ?
   (i) අංගුලිමාල තෙරුන්ගේය. (ii) කිසාගෝතමී තෙරණියගේය.
   (iii) මහාකාශ්‍යප තෙරුන්ගේය. (iv) මුගලන් තෙරුන්ගේය.

07. "පුබ්බාචරිය" යන නමින් හඳුන්වා ඇත්තේ කවරහුද ?
   (i) ළදරු පාසලේ ගුරුතුමී යි. (ii) මව්පිය දෙපළ ය.
   (iii) දහම් පාසල් ආචාර්යවරයා ය. (iv) බුදුරජාණන් වහන්සේ ය.

08. මවුපියන් හා දූ දරුවන් විසින් ඉටුකළ යුතු අන්‍යෝන්‍ය යුතුකම් පිළිබඳ සඳහන් සූත්‍රය කුමක්ද ?
   (i) ව්‍යග්ගපජ්ජ සූත්‍රය (ii) කාලාම සූත්‍රය
   (iii) සිගාලෝවාද සූත්‍රය (iv) රතන සූත්‍රය.

09. විශාලා මහනුවර ඇති වූ තුන්බිය දුරු කිරීම සඳහා දේශනා කළ, තෙරුවන් ගුණ ඇතුළත් සූත්‍රය කුමක්ද ?
   (i) මෙත්ත සූත්‍රය (ii) රතන සූත්‍රය
   (iii) මංගල සූත්‍රය (iv) සතිපට්ඨාන සූත්‍රය

e - LEARNING HJ NETWORK
BEST-HELPER FOR YOUR ONLINE LEARNING

10. බුදුරජාණන් වහන්සේ කැරකෙන ගැල් රෝදයකට උපමා කර ඇත්තේ මින් කුමක්ද ?

(i) අටලෝ දහම යි. (ii) සතර සංග්‍රහ වස්තු යි.
(iii) සතර කර්මක්ලේශ යි. (iv) සතර ඍද්ධි පාද යි.

11. පොළොන්නරුව රාජධානිය පිහිටවූයේ කිනම් රජතුමා විසින්ද ?

(i) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි. (ii) හතරවන මිහිඳු රජතුමා විසිනි.
(iii) වික්‍රමබාහු රජතුමා විසිනි. (iv) මහා විජයබාහු රජතුමා විසිනි.

12. භික්ෂූන් වහන්සේලාගේ විනය කර්ම සඳහා ඉදි කොට ඇති විශේෂ ස්ථානය හඳුන්වන නම කුමක්ද ?

(i) සීමා මාලකය (ii) සංඝාවාසය
(iii) ධර්ම ශාලාව (iv) සක්මන් මළුව

13. භාරතයේ සිට විදේශ රටවලට ධර්මදූත පිරිස පිටත්කර යැවීම සිදුවූයේ . . .

(i) බුද්ධ කාලයේ ය. (ii) පළමු ධර්ම සංගායනාවෙන් පසු ය.
(iii) තෙවන ධර්ම සංගායනාවෙන් පසු ය. (iv) දෙවන ධර්ම සංගායනාවෙන් පසු ය.

14. සුනීත, සෝපාක, පටාචාරා, කිසා ගෝතමී, යන අයට පිහිට වීමෙන් පිළිඹිබුවන්නේ බුදුරජාණන් වහන්සේගේ කිනම් ගුණයද ?

(i) තාදී ගුණය. (ii) අසරණසරණ ගුණය.
(iii) පුරිසදම්ම සාරථී ගුණය. (iv) සත්ථා ගුණය.

15. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව අතුරින් එකක් නොවන්නේ මින් කුමක්ද ?

(i) ධන හානිය. (ii) විලිබිය නැතිවීම.
(iii) අපකීර්තියට පත්වීම. (iv) ලෙඩරෝග අඩුවීම.

16. පූජා බුද්ධියෙන් කරන පරිත්‍යාග සිදු කළ යුත්තේ කා හටද ?

(i) දෙමව්පියන්ට ය. (ii) වැඩිහිටියන්ට ය.
(iii) මහා සංඝරත්නයට ය. (iv) දුගීමගී යාචකාදීන්ට ය.

17. පුද්ගල චරිත දියුණු කර ගැනීමට උපකාර වන ගුණධර්ම පහළොවක් ඉගැන්වෙන්නේ කිනම් සූත්‍රයේද ?

(i) රතන සූත්‍රයේ ය. (ii) කරණීය මෙත්ත සූත්‍රයේ ය.
(iii) මහාමංගල සූත්‍රයේ ය. (iv) පරාභව සූත්‍රයේ ය.

18. හේතු රාශියක් තුළින් ලොව පුද්ගලයා හා වස්තු හට ගැනීමත් පැවැත්මත් සිදුවන බව ඉගැන්වෙන්නේ . . .

(i) චතුරාර්ය සත්‍යයේ ය. (ii) බෞද්ධ කර්ම සංකල්පයේ ය.
(iii) පටිච්ච සමුප්පාදයෙනි. (iv) ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙනි.

19. ස්පර්ශය තුළින් ඇතිවන සැප, දුක හෝ මධ්‍යස්ථ බව හඳුන්වන්නේ . . .

(i) ඵස්ස යනුවෙනි. (ii) වේදනා යනුවෙනි.
(iii) සංඛාර යනුවෙනි. (iv) තණ්හා යනුවෙනි.

20. බුදුරදුන් වසල සූත්‍රය දේශනා කළේ කා හටද ?

(i) සුන්දරී භාරද්වාජ බමුණාට ය. (ii) අක්කෝස භාරද්වාජ බමුණාට ය.
(iii) අග්ගික භාරද්වාජ බමුණාට ය. (iv) කසී භාරද්වාජ බමුණාට ය.

(ලකුණු 02 x 20 = 40)

e - LEARNING
HJ NETWORK

## II කොටස

01. (i) දස පාරමිතා සඳහන්වන ගාථාවන් නිවැරදිව ලියන්න. (ලකුණු 03)

(ii) දානය පාරමිතාවක් බවට පත්වන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පාරමිතා නමැති ගුණධර්ම දහය යහපත් සාමකාමී සමාජයක් ගොඩනගා ගැනීම සඳහා හේතු වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 07)

02. (i) නිර්වාණය හඳුන්වා දීමට යොදා ගෙන ඇති යෙදුම් තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) දම්සක් පැවතුම් සූත්‍රයේ දුක්ඛ නිරෝධය හෙවත් දුකින් මිදීම විස්තර කර ඇති අයුරු දක්වන්න. (ලකුණු 05)

(iii) අටලෝ දහමට මුහුණ දීමට සිදුවන විට ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

03. (i) සමානාත්මතාව යනු කුමක්දැයි හඳුන්වා බුදුරජාණන් වහන්සේ සමානාත්මතාවයට අනුව ක්‍රියා කර ඇති අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පරෝපකාරය උතුම් ගුණයකි. අපට අනුන්ට උපකාර කිරීමට සිදුවන අවස්ථා පහක් නම් කර ඒ අවස්ථාවල කළ හැකි උපකාර දෙක බැගින් ලියන්න. (ලකුණු 05)

(iii) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳව පාසල් ශිෂ්‍යයන් දැනුවත් කිරීමට සුදුසු අත්පත්‍රිකාවක් පිළියෙළ කරන්න. (ලකුණු 07)

04. (i) සමථ භාවනාව සඳහා ඒ නම යෙදෙන්නේ ඇයි දැයි දක්වා සමථ භාවනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 03)

(ii) සමථ භාවනාවෙන් උපදවා ගත හැකි අෂ්ට සමාපත්ති වලින් ලැබෙන ආනිසංස පහකි. ඒ මොනවාද ? (ලකුණු 05)

(iii) විදර්ශනා භාවනාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කර සමථ භාවනාවේ හා විදර්ශනා භාවනාවේ වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 07)

## III කොටස

05. (i) සිංහලයට නගන්න.

ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං පංච සීලං ධම්මං යාචාමි. භන්තේ මේ අනුග්ගහං කත්වා සීලං දේථ. (ලකුණු 05)

(ii) පාලියට නගන්න.

(i) ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අරහං නම් වන සේක.

(ii) බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සද්ධර්මය ස්වාක්ඛාතය.

(iii) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුපටිපන්නය.

(iv) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා පුරුෂ යුගල සතරකි.

(v) ශ්‍රාවක සංඝයා පුරුෂ පුද්ගලයන් වශයෙන් අට දෙනෙකි.

(ලකුණු 02 x 05 = 10)

E - LEARNING
HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2 කායප්‍රසාද - ජිව්හාප්‍රසාද = පසාද රූප<br>3 ස්ත්‍රී භාව - පුරුෂ භාව = භාව රූප<br>4 ලහුතා - මුදුතා = විකාර රූප<br>5 ජරතා - අනිච්චතා = ලක්ෂණ රූප<br>6 කාය විඤ්ඤත්ති - වචී විඤ්ඤත්ති = විඤ්ඤත්ති රූප<br>7 රූප - ශබ්ද = ගෝචර රූප | | | |

E - LEARNING
HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

**බුද්ධශාසන අමාත්‍යාංශය**

**බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**

ශ්‍රී බු. ව. 2563 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2019

**09 ශ්‍රේණිය** **පිළිතුරු පත්‍රය**

---

(i) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (ii) හා (iii) කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

(i) කොටසට ලකුණු 40 කි. (ii) හා (iii) කොටස් සඳහා ලකුණු (15 × 04) 60 කි.

**මූලාශ්‍රය - 09 ශ්‍රේණිය පෙළ පොත**

**i කොටස**

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

| ප්‍රශ්න අංකය | පිළිතුර | පිටු අංකය | ඡේදය /ගාථාව /පාඨය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | (ii) ධර්මය යි. | 03 | 01 | 02 |
| 02 | (iii) සුන්දරික භාරද්වාජ බමුණාටය. | 08 | 02 | 02 |
| 03 | (iv) ලිච්ඡවී රජ දරුවන් විසිනි. | 09 | 02 | 02 |
| 04 | (iii) සතර සෘද්ධිපාද ය. | 10 | 03 | 02 |
| 05 | (iv) සුභද්‍ර හිමියන් ය. | 12 | 03 | 02 |
| 06 | (i) අංගුලිමාල තෙරුන්ගේය. | 17 | 05 | 02 |
| 07 | (ii) මව්පිය දෙපළ ය. | 20 | 03 | 02 |
| 08 | (iii) සිගාලෝවාද සූත්‍රය | 20 | 04 | 02 |
| 09 | (ii) රතන සූත්‍රය | 30 | 02 | 02 |
| 10 | (i) අටලෝ දහම යි. | 47 | 04 | 02 |
| 11 | (iv) මහා විජයබාහු රජතුමා විසිනි. | 50 | 02 | 02 |
| 12 | (i) සීමා මාලකය | 57 | 03 | 02 |
| 13 | (iii) තෙවන ධර්ම සංගායනාවෙන් පසු ය. | 65 | 04 | 02 |
| 14 | (ii) අසරණසරණ ගුණය. | 69 | 03 | 02 |
| 15 | (iv) ලෙඩරෝග අඩුවීම. | 78 | 02 | 02 |
| 16 | (iii) මහා සංඝරත්නයට ය. | 83 | 01 | 02 |
| 17 | (ii) කරණීය මෙත්ත සූත්‍රයේය. | 88 | 02 | 02 |
| 18 | (iii) පටිච්ච සමුප්පාදයෙනි. | 91 | 02 | 02 |
| 19 | (ii) වේදනා යනුවෙනි | 93 | 04 | 02 |
| 20 | (iii) අග්ගික භාරද්වාජ බමුණාට ය. | 101 | 03 | 02 |

**ii - කොටස**

| ප්‍රශ්න අංකය | | පිළිතුර | පිටු අංකය | ඡේදය /ගාථාව /පාඨය | ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | (i) | දානං සීලංච නෙක්ඛම්මං - පඤ්ඤා විරියේන පංචමං<br>ඛන්ති සච්චමධිට්ඨානං - මෙත්තුපෙක්ඛාති මේ දස | 24 | 02 | 03 |
| | (ii) | දන් දීම පාරමිතාවක් වීමට නම් තණ්හාවෙන් තොර විය යුතුය. තෙවත් ලාභ අපේක්ෂාවෙන් තොර විය යුතුය. මානයෙන් තොර විය යුතුය. මිථ්‍යාදෘෂ්ටියෙන් තොර විය යුතුය. කෙලෙස් වලින් බැහැර වී කරුණාවෙන් යුතුව අනුන්ගේ අපහසුතා දැක ඒවායින් මුදවාලීමේ අදහසින් දන් දිය යුතුය. දන් දීමේ සැබෑ අවශ්‍යතාවය තේරුම්ගෙන දන් දීමේ සැබෑ ආනිසංස තේරුම් ගෙන නුවණින් ගෙවත් උපාය කෞශල්‍යයන් යුතුව දන් දිය යුතුය. දානය පාරමිතාවක් බවට පත් වන්නේ එවිටය. | 25 | | 05 |
| | (iii) | පාරමිතා දහය නම් කර කෙටියෙන් හඳුන්වා ඒවායේ ඇතුළත් ගුණ ධර්ම යහපත් සමාජයක් ගොඩනගා ගැනීමට උපකාර වන අයුරු පෙන්වා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න. | 26<br>28 | | 07 |
| 02 | (i) | 1 රාගක්ඛය (රාගය නැතිවීම)<br>2 දෝසක්ඛය (ද්වේෂය නැතිවීම)<br>3 මෝහක්ඛය (මෝහය නැතිවීම) | 39 | 02 | 03 |
| | (ii) | 1 තණ්හාය අසේස විරාග නිරෝධෝ - තණ්හාව ඉතිරි නොවනසේ නැතිකිරීම.<br>2 චාගෝ - තණ්හාව දුරු කිරීම.<br>3 පටිනිස්සග්ගෝ - තණ්හාව බැහැර කිරීම.<br>4 මුත්ති - තණ්හාවෙන් මිදීම.<br>5 අනාලයෝ - ඇල්මක් නොවීම. | 38 | 03 | 05 |
| | (iii) | අටලෝ දහම නම් කර හඳුන්වා ඊට මුහුණ දෙන අයුරු පැහැදිලි කෙරෙන ස්වාධීන පිළිතුරක් අපේක්ෂා කෙරේ. | 44<br>45<br>පිටු ඇසුරෙන් | | 07 |

e - LEARNING
HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

| | | | | | |
|---|---|---|---|---|---|
| 03 | (i) | සමානාත්මතාවය යනු සියලු දෙනාටම සමානව සැලකීමයි.(ජාති කුල පන්ති උස් මිටි කලු සුදු භේද නැතිව).<br>• දේවදත්තට අංගුලිමාලට ධනපාල හස්තියාට රාහුල කුමාරයාට එකසේ මෛත්‍රිය පැතිර වීම.<br>• දුප්පත් පෝසත්, උස් පහත් භේදයකින් තොරව ගෙපිළිවෙලින් පිඩු සිගා යැම.<br>• සිව්වනක් පිරිසට තනතුරු පිරිනැමීමෙදී උස් පහත් බව නොසලකා දක්ෂතා සලකා පිරිනැමීම. | 75 | 3-4 | 03 |
| | (ii) | 1 දුප්පත් අසරණ අයට උදව් කිරීම.<br>මුදලක් දීම, ආහාර පාන ලබාදීම, ඇඳුම් පැළඳුම් ලබාදීම, ගේදොර උපකරණ ලබාදීම.<br>2 මා පිය දූ දරු නෑයන්ට පිහිට වීම.<br>මිළ මුදලින් උපකාර කිරීම, ආහාර පාන වලින් උපකාර කිරීම,නැවීම , කැවීම, බෙහෙත් ලබාදීම. වැඩ කටයුතුවලට උදව් කිරීම<br>3 අසල් වැසියන්ට පිහිට වීම.<br>මගුල් අවමගුල් අවස්ථාවල උපකාර කිරීම.විපතක් වූ විට අවශ්‍ය උපකාර කිරීම. ලෙඩ රෝග ඇති වූ විට උපකාර කිරීම, අගහිඟ කම් වලදී උපකාර කිරීම.<br>4 වියපත් වූවන්ට උපකාර කිරීම.<br>ආහාරපාන ලබාදීම, ලේ දන් දීම, රෝදපුටු ආදී වෛද්‍ය උපකරණ ලබාදීම. ඖෂධ ලබාදීම.<br>5 පොදු කටයුතු වලදී උදව් කිරීම.<br>ළිං පොකුණු මං මාවත් සැකසීම සහ පිරිසිදු කිරීමට උපකාර කිරීම. ගමේ සමිති සමාගම් වලට සම්බන්ධ වී අවශ්‍ය උපකාර කිරීම. විහාරස්ථානයේ පිංකම් වලදී උත්සව වලදී අවශ්‍ය උපකාර කිරීම. | 84<br>86 | | 05 |
| | (iii) | ස්වාධීන පිළිතුරකි | | | 07 |
| 04 | (i) | කාමච්ඡන්ද ආදී නීවරණ පහ තාවකාලිකව සන්සිඳුවන හා සමථයට පත් කරවන බැවින් සමථ භාවනා යන නම යෙදේ.<br>චිත්ත භාවනා<br>සමාධි භාවනා යනු සමථ භාවනාවට යෙදෙන වෙනත් නම් දෙකකි. | 95 | 04 | 03 |
| | (ii) | 1 මේ ජීවිතයේදීම සුව විඳිය හැකි වීම.<br>2 විපස්සනා වැඩිය හැකි වීම.<br>3 අභිඥා පහ ලැබිය හැකි වීම.<br>4 සුගතියෙහි උපත ලද හැකි වීම.<br>5 නිරෝධ සමාපත්ති සුව විඳිය හැකි වීම. | 98 | 06 | 05 |
| | (iii) | නාම රූප ධර්ම අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කිරීම විදර්ශනා වැඩීමයි. මගේ සිරුරෙහි ඇති ඇස් කන් නාස ආදී අවයව සියල්ලම අනිත්‍යය. වේදනා සංඥා ආදී චෛතසිකත්, සිතත් අනිත්‍යය. දුක්ඛය. අනාත්මය. අන් සියලු දෙනාගේ නාම රූපත් ලොව ඇති සියල්ලත් අනිත්‍යය. දුක්ඛය. අනාත්මය. තිලකුණු, ත්‍රිලක්ෂණ යයි කියනු ලබන්නේ මේ ලක්ෂණයන්ටය. සියලු දේ වල ඇති මේ ත්‍රිලක්ෂණය නුවණින් සිහි කරමින් කරන භාවනාව හැඳින්වෙන්නේ විදර්ශනා භාවනාව යනුවෙනි. හේතූන්ගෙන් හටගත් පණ ඇති පණ නැති සියල්ල සංස්කාරය. සංස්කාර වල නියම ස්වභාවය විදර්ශනා නුවණින් අවබෝධ වන විට ස්ත්‍රී පුරුෂ ධන ධාන්‍ය යාන වාහන ඇඳුම් පැළඳුම් ආදී සියල්ල සතුට පිණිස නොපවතින බව වැටහෙයි. එවිට ඒවා ගැන කළකිරෙයි. කළකිරීම නිසා ඒවාට ඇති ඇලීම නැති වෙයි. ඇලීම බැඳීම නැති විට ඒවායින් ඉවත් වීම මිදීම සිදුවෙයි. මේ මිදීම යනු රාගාදී සියලු කෙලෙසුන්ගෙන් මිදීමයි. රහත් වීමයි. විදර්ශනා භාවනාව ලැබෙන්නේ බුදුසසුන පවතින කාලයක පමණි.<br><br>සමථ භාවනාවෙන් පංච අභිඥා අෂ්ඨ සමාපත්ති ලැබිය හැකිය. කෙලෙස් වලින් මිදිය නොහැකිය. විදර්ශනා භාවනාවෙන් කෙලෙසුන් කෙරෙන් මිදිය හැකිය. | 99 | | 07 |
| iii - කොටස | | | | | |
| 05 | (i) | අවසර ස්වාමීනි, මම තිසරණය සහිත පංච ශීලය ඉල්ලමි. ස්වාමීනි, මට අනුකම්පා කොට සිල් දෙන්න. | 59 | 05 | 05 |
| | (ii) | i. සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ.<br>ii. ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ .<br>iii. සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ.<br>iv. භගවතෝ සාවක සංඝෝ චත්තාරි පුරිස යුගානි.<br>v. සාවක සංඝෝ අට්ඨ පුරිස පුග්ගලා. | 118<br>119 | | 10 |
| | | | | | |
| 06 | (i) | බිඳෙන නිසා, වෙනස් වන නිසා රූප යැයි කියයි. සීතලෙන් උණුසුමෙන් කුසගින්නෙන් බිඳේ. | 124 | 04 | 03 |
| | (ii) | 1 උපචය - පළමු වරට රූපය ඉපදීම උපචයයි.<br>2 සන්තති - උපන් රූපය බිඳී ගිය විට නැවත රූපයක් හටගනී.මෙසේ බිඳී ගිය රූප වෙනුවට නැවත නැවත රූප ඉපදීම සන්තතියයි. රූප පරම්පරාවයි.<br>3 ජරතා - රූප දිරා යැම ජරතාවයි.<br>4 අනිච්චතා - රූප විනාශ වීමයි.<br>(නම් කිරීමට ලකුණු 04 යි. හැඳින්වීමට 01යි.) | 128 | 03 | 05 |
| | (iii) | 1 පඨවි - තේජෝ = මහාභූත රූප | 129 | | 07 |



e - LEARNING HJ NETWORK